# ළමුන් ප්‍රචණ්ඩත්වයට හා අසභ්‍යත්වයට යොමුවීම කෙරෙහි රූපවාහිනී චිත්‍රපටවල බලපෑම

*ඒ.ජී.එස්.ඩී. කරුණාරත්න*[1]

යෞවනත්වයට පා තබන ළමුන් වැඩිහිටි ලෝකයට ප්‍රවිශ්ටවීමට බලවත් ආශාවක් දක්වන අතර ඒ සඳහා අවශ්‍යය කරන පසුබිම රූපවාහිනී තිරයෙන් විවර වන චිත්‍රපටයෙන් ලැබෙනු නියත ය. මුල් කාල වකවානුව තුළ දී සිනමාව වෙන ම අංශයක් ලෙස පැවතුණ ද රූපවාහිනියෙහි ආගමනයත් සමග එම ගමන්මග වෙනසකට බඳුන් වන්නට විය. මෙම විපර්යාසය පදනම් කොට ගෙන සිනමාව හා රූපවාහිනිය අතර වරින් වර ඝට්ඨනකාරී තත්ත්වයන් ඇති වු නමුත් එහි අවසාන ප්‍රතිඵලය වූයේ මේ ද්විත්වය අතර සහසම්බන්ධතාවක් නිර්මාණය වීමයි. එහි දී ළමා චිත්‍රපට, වැඩිහිටියන්ට පමණි ආදි වූ චිත්‍රපට නිර්මාණය වන අතර ඒ සඳහා වැඩි නැඹුරුතාවක් දක්වන්නේ ළමා පරපුර ය. සිනමාව තුළ භාවිත වු Adults only, Erotic, soft Pronography, Hardcare Pronography යන වදන් හරහා ළමා ප්‍රේක්ෂකයාට චිත්‍රපට නැරඹීමේ අවකාශයෙහි සීමාවීමක් සිදු වූ අතර අසභ්‍යත්වය හා ලිංගිකත්වය කැටි සිනමා කෘති ළමා ප්‍රේක්ෂකයාට තහනම් විය. මෙවන් වපසරියක් හමුවේ රූපවාහිනිය ඔස්සේ චිත්‍රපට විකාශය වීම ළමා ප්‍රේක්ෂකයා වඩාත් තෘප්ත කරන ලද්දක් වූහ. රූපවාහිනී චිත්‍රපටයන්හි ලිංගිකත්වය නිරූපිත දර්ශන සහා ප්‍රචණ්ඩත්වය ඉස්මතු කරන දර්ශන කිසිදු වාරණයකින් තොර ව ඍජු ව ප්‍රේක්ෂකයා වෙත මුදා හැරීම ළමා ප්‍රේක්ෂකයාට නැවුම් අත්දැකීමක් ගෙන දෙන්නට සමත් වූවකි. මෙය නුහුරු නුපුරුදු අත්දැකීමක් නිසා ම ළමුන්ගේ වැඩි අවධානයක් මේ සදහා යොමු විය. එසේ ආරම්භ වන ගමන අද විනාශයක් දක්වා වර්ධනය වී ඇත. ඒ අනුව ළමුන් ප්‍රචණ්ඩත්වයට හා අසභ්‍යත්වයට යොමුවීම කෙරෙහි රූපවාහිනී චිත්‍රපටවල බලපෑම කෙබඳු ද යන්න අධ්‍යයනය ගැටලුව ලෙස යොදා ගනිමින් මෙම අධ්‍යයනය සිදු කොට ඇත. දත්ත රැස් කිරීමේ දී ගුණාත්මක පර්යේෂණ ක්‍රමවේදය යටතේ 01 වසරේ සිට 06 වසර දක්වා ඉගෙනුම ලබන සිසුන් 20 දෙනෙක් අහඹු ලෙස යොදා ගනිමින් නිරීක්ෂණය සහ සම්මුඛ සාකච්ඡා සඳහා භාජනය ලදී. එමෙන් ම එලෙස ලබා ගත් ප්‍රාථමික දත්ත සංඛ්‍යාත්මක විශ්ලේෂණ ක්‍රම යොදා ගනිමින් දත්ත විශ්ලේෂණය කොට ඇත. ගුණගරුක සදාචාර සම්පන්න දරුවකු සමාජයට දායාද කිරීම දෙමාපියන්ගේ පරමාර්ථය වූව ද අද එය වියැකී යන යථාර්ථයක් බවට පත්වීමට රූපවාහිනිය මඟින් විකාශය වන චිත්‍රපටය ප්‍රබල දායකත්වයක් සපයා ඇත. අද වාණිජත්වය ඉලක්ක කර ගනිමින් නිර්මාණය වන ප්‍රචණ්ඩ හා අසැබි දර්ශන සහිත චිත්‍රපට රූපවාහිනිය හරහා තිරගත වීම ළමා මනස විකෘති තත්ත්වයන්ට පත්වීමට සහ ප්‍රචණ්ඩත්වයට පත් විමට හේතු වන ප්‍රබල සාධකයක් වී අවසාන ය. එකී සාධකය හමුවේ වත්මන් තරගකාරී ලෝකයෙහි අධ්‍යාපනයට ඇති අවධානය ක්‍රමයෙන් ඍණාත්මක අගයක් ගෙන ඇති බව මෙම පර්යේෂණය හරහා පුළුල් අවබෝධයක් ලබා ගත හැකි ය.

***ප්‍රමුඛ පදඃ*** රූපවාහිනිය, චිත්‍රපටය, ළමා පරපුර, ළමා ප්‍රේක්ෂකයා, ළමා ප්‍රචණ්ඩත්වය සහා අසභ්‍යයත්වය

[1] ජන සන්නිවේදන අධ්‍යනාංශය මානව ශාස්ත්‍ර පිඨය ශ්‍රී ලංකා රජරට විශ්ව විද්‍යාලය මිහින්තලේ ssh1819177@ssh.rjt.ac.lk